## මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා අරමුදල

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මාගේ පරීක්ෂණයන්ගෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මිනුම් ඒකක ප්‍රමිත හා සේවා දෙපාර්තමේන්තුවේ මිනුම් ඒකක ප්‍රමිත හා සේවා අරමුදලේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට මිනුම් ඒකක ප්‍රමිත හා සේවා දෙපාර්තමේන්තුවේ මිනුම් ඒකක ප්‍රමිත හා සේවා අරමුදලේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

පහත කරුණු අනාවරණය විය.

#### 1.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

1995 අංක 35 දරන පනතේ 35 (2) වගන්තිය අනුව, අය කරන ලබන සෑම ගාස්තුවකින්ම 2/3 ක් මිනම් ඒකක ප්‍රමිති සහ සේවා අරමුදලට බැර කළ යුතු වුවද, මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල එය මුළු ආදායමින් 2/3 ක් අරමුදලට ගිණුම්ගත වන බව දක්වා තිබුණි. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූණු රු.104,683,392 ක් වූ මුදා තැබීමේ ආදායමින් 1/3 ක වටිනාකමින් රු.34,894,464 ක් රජයේ අරමුදලට බැර කළ යුතු වුවත්, රු.35,397,261 ක් එම අරමුදලට බැර කිරීම හේතුවෙන් රු.502,797 ක වෙනසක් නිරීක්ෂණය විය.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු අනාවරණය විය.

(අ) ගොඩනැගිල හා කාර්යාල උපකරණ ක්ෂය කළ යුතු වුවද, අරමුදල සතු ගොඩනැගිලි හා කාර්යාල උපකරණ ක්ෂය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ මුල් ගල් තැබීමේ උත්සවය සඳහා දරන ලද රු. 469,055 ක් හා යන්ත්‍ර මිලදී ගැනීම සඳහා ගෙවා තිබූ රු.55,328 ක් වූ පුවත්පත් දැන්වීම් සඳහා දරන ලද වියදම් ගොඩනැගිලි හා යන්ත්‍ර උපකරණ ගිණුම්වල ඇතුලත් කර තිබීම හේතුවෙන් ඉහත වටිනාකමට සමාන අගයකින් අදාල වත්කම් ගණුම් ශේෂ වැඩියෙන් දක්වා තිබුණ.

(ඇ) ලදුපත් අනුව, එකතුව රු. 215,765 ක් වූ බදු අය නොකළ යුතු ලැබීම් වෙනුවෙන් ගණනය කළ රු. 32,365 ක බදු මුදලක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී ඉඩමක් වෙන් කර ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා තිබූ රු. 38,400,000 ක මුදලක් ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණද, 2011 දෙසැම්බර් 31 දින වන විටත් එම ඉඩම අත්පත් කර ගෙන නොතිබුණි.

(ඉ) විගණනයට ඉදිරිපත් කරන ලද වාහන ලැයිස්තුව අනුව, එකතුව යූරෝ 458,006 ක් වූ වාහන දෙකක වටිනාකම රුපියල් අගයට පරිවර්තනය කර ගිණුම්ගත කර නොතිබුණි.

### 1.2.3 නොසැසඳුනු පාලන ගිණුම්

පහත කරුණු අනාවරණය විය.

(අ) ලදුපත් අනුව ගණනය වූ සමාලෝචිත වර්ෂයේ මුද්‍රා තැබීමේ ගාස්තු ආදායම රු.104,893,461 ක් වුවද, ගිණුම් වල එම ආදායම රු.104,683,392 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු. 210,069 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) විගණනයේදී කරන ලද සනාථ කිරීම් අනුව, වර්ෂයේ එකතුවූ එකතුකළ අගය මත බද්ද රු.12,587,211 ක් හා ජාතිය ගොඩ නැගීමේ බද්ද රු.3,146,802 ක් වුවද අවසන් මූල්‍ය ප්‍රකාශන වල එම බදු පිළිවෙලින් රු.12,745,630 ක් හා රු.3,186,407 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.158,419 ක හා රු.39,605 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

### 1.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

2010 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව අනුව විවිධ ගාස්තු ආදායම රු.115,252,155 ක් වුවද, විගණනයේදී සිදු කරන ලද ගණනය කිරීම් අනුව ආදායම රු.105,893,461 ක් වීම හේතුවෙන් ආදායමේ රු.9,358,694 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| ගිණුම් විස්තරය | වටිනාකම | විගණනයට ඉදිරිපත් නොවූ ලිඛිත සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (අ) දේපල පිරියත හා උපකරණ | 106,629,763 | (i) ස්ථාවර වත්කම් ලේඛනය<br>(ii) විස්තරාත්මක උපලේඛනය<br>(iii) 2010 දෙසැම්බර් 31 දිනට වත්කම් පිළබඳ සමීක්ෂණ වාර්තා |
| (ආ) සමාලෝචිත වර්ෂය තුළ විෂයයන් 10 කට අදාල ගෙවීම් | 7,217,840 | මුදල් ලබා ගත් බවට කුවිතාන්සි |

### 1.2.6 නීති , රීති, රෙගුලාසි වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති , රීති , රෙගුලාසි වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති , රීති , රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| **(අ)** 2002 අංක 14 දරන එකතු කළ අගය මත බද පනතේ 64 වන වගන්තිය හා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් 2002 සැප්තැම්බර් 06 දිනැතිව නිකුත් කර ඇති එකතු කළ අගය මත බදු සම්බන්ධ මාර්ගෝපදේශ අත්පොතේ 15.2 පරිච්ඡේදය | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත කරන ප්‍රේෂණ වලට අදාලව ආයතනය විසින් පාලන ගිණුමක් මගින් වාර්තා තබා ගැනීමක් සිදු නොකරන අතර , ඒ හෙයින් ගාස්තු සමග අය කරනු ලබන නිමවුම් බදු වලින් යෙදවුම් බදු අඩු කිරීමකින් තොරව සම්පූර්ණ නිමවුම් බදු මුදල වූ රු. 12,745,630 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර තිබුණි. |

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

(i) අංක 756 — ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් මට්ටමේ පවත්වා ගෙන යන ප්‍රාදේශීය කාර්යාලවල 2010 වර්ෂය වෙනුවෙන් වත්කම් සමීක්ෂණය කිරීම සඳහා 2010 දෙසැම්බර් 31 වන විට සමීක්ෂණ මණ්ඩල පත්කර නොතිබුණු අතර 2009 වසරේ දිස්ත්‍රික් කාර්යාලවල භාණ්ඩ සමීක්ෂණ වාර්තා හා නිර්දේශ , 2011 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

(ii) අංක 1646 — 2010 වර්ෂයට අදාලව අරමුදලට අයත් වාහනවල සමහර මාස වලට අදාල දෛනික සටහන් හා මාසික සාරාංශ සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබ අතර ඉදිරිපත් කළ ඒවාද නියමිත දිනයට වඩා ප්‍රමාදවී ඉදිරිපත් කර තිබුණි.

(iii) අංක 1646 (ආ) — වාහනද ඒවායේ උපකරණද පිළිබඳව සම්පූර්ණ සමීක්ෂණයක් පැවැත්විය යුතු වූවත් එසේ සිදු කර තිබුණු බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

**(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

(i) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 චක්‍රලේඛයේ

- 2:11 උප වගන්තිය — ආයතනය සතු වාහනවල දැවෙන ඉන්ධන ප්‍රමාණය සෑම මාස 06 කටම වරක් පරීක්ෂා කළ යුතු වූවද , එසේ සිදු කර නොතිබුණි.

- 2:12 උප වගන්තිය — සංචිත වාහන වල තෙල් ටැංකි සති දෙකකට වරක් සම්පූර්ණයෙන් පිරවිය යුතු වුවද ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ii)1997 පෙබරවාරි 03 දිනැති අංක 06/97 — 2009 මැයි 05 දින හිටපු අධ්‍යක්ෂක විශ්‍රාමයාමෙන් පසු 2012 පෙබරවාරි 27 වන තුරුත් එම ධූරය පුරප්පාඩුව

| | |
|---|---|
| චක්‍රලේඛය | පවතී. |

**(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ**

| | |
|---|---|
| (i) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පී/එෆ්/ 423 දරන චක්‍රලේඛයේ 04:2 (ආ) වගන්තිය | අරමුදල වෙත ලැබෙන සියලුම මුදල් ලැබීම් වෙනුවෙන් ලදුපත් නිකුත් කිරීමක් සිදු කර නොතිබුණි. |
| (ii) 2009 සැප්තැම්බර් 18 දිනැති අංක පී/එෆ්/ 437 | ආයතනයට ආදාල වන පරිදි වාහන හා ගොඩනැගිලි සඳහා නියමිත රක්ෂණ ආවරණයන් ලබා ගත යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුල අරමුදලේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු.70,255,700 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු.69,333,395 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සසදන කළ මූල්‍ය ප්‍රතිඵලයන්හි රු.922,305 ක වර්ධනයක් ඇති වීම සඳහා මුද්‍රා තැබීමේ ගාස්තු ආදායම රු.15,275,161 කින් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

#### 2.2.1 කළමණාකරණ අකාර්යක්ෂමතා

2009 දෙසැම්බර් 09 දින ලබා දුන් කැබිනට් මණ්ඩල අනුමැතිය මත නව විද්‍යාගාරයක් ඉදිකිරීම සඳහා රු.575,122 ක වියදමින් 2009 දෙසැම්බර් 21 දින මුල් ගල් තබා තිබුණු අතර, 2009 වර්ෂයේදී රු.48,079,314 ක් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට හා අනෙකුත් පාර්ශව වෙත ගෙවා තිබුණු අතර, 2010 වර්ෂයේදී මේ සඳහා රු.513,746 ක් ද ගෙවා තිබුණ. නමුත් මෙම වාර්තාවේ දින වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

#### 2.2.2 අභ්‍යන්තර විගණනය

මිනුම් ඒකක ප්‍රමිති සහ සෙවා දෙපාර්තමේන්තුව සඳහා වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමූපකාර හා පාර්භෝගික සේවා අමාත්‍යාංශය විසින් අභ්‍යන්තර විගණන වැඩසටහනක් සකස් කර තිබුණද, සමාලෝචිත වර්ෂයට අදාලව විගණන වාර්තා කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.3 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත මුළු වියදමට සාපේක්ෂව සත්‍ය මුළු වියදම අතර විචලතාවය රු. 3,927,968 ක් වන අතර එය 16.93% කින් අඩුවීමක් බව නිරීක්ෂණය විය.

## 3. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) වත්කම් පරිපාලනය
(ආ) ගමන් වියදම් හා අතිකාල වියදම්
(ඇ) අභ්‍යන්තර විගණනය
(ඈ) ආදායම් ගිණුම් ගත කිරීම
(ඉ) මුදල් පොත හා අනෙකුත් ගිණුම් උපලේඛන පවත්වා ගෙන යාම
(ඊ) ඉන්ධන භාවිතය හා ඉන්ධන සඳහා ගෙවීම් කිරීම්
(උ) මිනුම් උපකරණ සත්‍යාක්ෂණය, ලේඛන සැසඳීම හා පාර්භෝගික ආරක්ෂාව